# 2022.05.17 මහා සභා රැස්වීම් වාර්තාව

## රැස්වීම සඳහා සහභාගී වූ ගරු මන්ත්‍රීවරුන්

01.ප්‍රාදේශීය සභා ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා
02.ප්‍රාදේශීය සභා ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා
03. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා
04. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා
05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය
06.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා
07. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා
08. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා
09. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා
10. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එන්.ජී.සුනිල් බණ්ඩාර හපුගම්මන මහතා
11. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා
12.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
13. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා
14. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා
15.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා
16. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය
17. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය
18.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය
19.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය
20.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා
21.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා
22.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා
23.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය
24.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය
25.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා
26.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා
27.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා

<u>රැස්වීම සඳහා සහභාගි නොවූ ගරු මන්ත්‍රීවරුන්</u>

01. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා
02. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා
03. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා
04. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා
05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා
06 .ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා
07.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා

08. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.ඒ.බංඩාරමැණිකා මහත්මිය

09. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා

10. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා

11.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා

**ආගම සිහි කිරීම.**

ප්‍රථමයෙන් ජාතික ගීය වාදනය, ආගම සිහිකිරීමෙන් අනතුරුව මිය ගිය රණවිරුවන් සිහිකර ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව.10.00 ට පමණ ගරු සභාවේ කටයුතු න්‍යාය පත්‍රානුකූලව ආරම්භ කරන ලදී.2022 මැයි මස මහා සභා රැස්වීමට සහභාගි වන ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මණ්ඩලය ,ලේකම් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරීන් , මාධ්‍යවේදීන් ඇතුළු සහභාගි වී සිටින සියලු දෙනාට ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරන ලද අතර සියලු දෙනාම ගෞරවයෙන් පිළිගන්නා ලදී.

**01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

**I.2022.04.08 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව සම්මත කිරීම.**

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2022.04.08 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාවේ අඩුපාඩු ඇත්නම් එය පෙන්වා දෙන ලෙසත් , එසේ නොමැති නම් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලෙසත් දන්වා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022.04.08 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්.පයිසර් මහතා - (ශ්‍රී.ල.මු.කො.)</u>**

2022.04.08 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ඒ අනුව 2022.04.08 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.04.08 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.**

ගරු සභාපතිතුමා විසින් 2022.04.08 දින මහා සභාවේ ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී.

**03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සංනිවේදන.**

**I.පඩුවස්නුවර බල ප්‍රදේශයේ ජනතාව කහ වගාවේ නිරත වී පාඩු සිදු වී අසරණ තත්ත්වයට පත් වීම සම්බන්ධව.**

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර බල ප්‍රදේශයේ ජනතාව පසුගිය කන්නයේ කහ වගාවේ නිරත වී පාඩු සිදු වී අසරණ තත්ත්වයට පත් වීම සම්බන්ධව විශේෂ යෝජනාවක් ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා.එම යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සඳහා යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය - (එ.ජා.ප.)</u>**

පඩුවස්නුවර බල ප්‍රදේශයේ ජනතාව පසුගිය කන්නයේ කහ වගාවේ නිරත වී පාඩු සිදු වී අසරණ තත්ත්වයට පත් වීම සම්බන්ධව අදහස් දැක්වීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

පඩුවස්නුවර බල ප්‍රදේශයේ ජනතාව පසුගිය කන්නයේ කහ වගාවේ නිරත වී පාඩු සිදු වී අසරණ තත්ත්වයට පත් වීම සම්බන්ධව අදහස් දැක්වීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඩුවස්නුවර බල ප්‍රදේශයේ ජනතාව පසුගිය කන්නයේ කහ වගාවේ නිරත වී පාඩු සිදු වී අසරණ තත්ත්වයට පත් වීම සම්බන්ධව අදහස් දැක්වීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සහා සම්මත කරන ලදී.**

## II.නව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සුභ පැතීම.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

නව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සුභ පැතීම සඳහා විශේෂ යෝජනාවක් ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා.එම යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සඳහා යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා - (එ.ජා.ප.)</u>**

නව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සුභ පැතීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය - (එ.ජා.ප.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

නව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සුභ පැතීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව නව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සුභ පැතීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සහා සම්මත කරන ලදී.**

## III.MG -330 මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ 2022 ජනවාරි 28 වන දින මුදල් කමිටු තීරණය පරිදි එදින සිට අප්‍රේල් 31 වන දින දක්වා වූ අලුත්වැඩියාව සම්බන්ධයෙන් ඇති වී ඇති අර්බුදය සම්බන්ධව කරුණු දැන ගැනීම.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

MG -330 මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ 2022 ජනවාරි 28 වන දින මුදල් කමිටු තීරණය පරිදි එදින සිට අප්‍රේල් 31 වන දින දක්වා වූ අලුත්වැඩියාව සම්බන්ධයෙන් ඇති වී ඇති අර්බුදය සම්බන්ධව කරුණු දැන ගැනීම සඳහා විශේෂ යෝජනාවක් ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා.එම යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සඳහා යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

MG -330 මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ 2022 ජනවාරි 28 වන දින මුදල් කමිටු තීරණය පරිදි එදින සිට අප්‍රේල් 31 වන දින දක්වා වූ අලුත්වැඩියාව සම්බන්ධයෙන් ඇති වී ඇති අර්බුදය සම්බන්ධව කරුණු දැන ගැනීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

MG -330 මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ 2022 ජනවාරි 28 වන දින මුදල් කමිටු තීරණය පරිදි එදින සිට අප්‍රේල් 31 වන දින දක්වා වූ අලුත්වැඩියාව සම්බන්ධයෙන් ඇති වී ඇති අර්බුදය සම්බන්ධව කරුණු දැන ගැනීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව MG -330 මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ 2022 ජනවාරි 28 වන දින මුදල් කමිටු තීරණය පරිදි එදින සිට අප්‍රේල් 31 වන දින දක්වා වූ අලුත්වැඩියාව සම්බන්ධයෙන් ඇති වී ඇති අර්බුදය සම්බන්ධව කරුණු**

**දැන ගැනීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## IV.නිවාඩු අනුමත කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා , ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මොහොම්මදු තාහීර් මොහොම්මදු ෂාබීර් මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදී රාජගුරු මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජයන්ත හේරත් මහතා , ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි .ඒ.බංඩාර මැණිකා මහත්මිය , ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා.</u>

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා , ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මොහොම්මදු තාහීර් මොහොම්මදු ෂාබීර් මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදී මල්ලවආරච්චි මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජයන්ත හේරත් මහතා , ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි .ඒ.බංඩාර මැණිකා මහත්මිය , ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ .ජා.ප.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා , ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මොහොම්මදු තාහීර් මොහොම්මදු ෂාබීර් මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදී රාජගුරු මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජයන්ත හේරත් මහතා , ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි .ඒ.බංඩාර මැණිකා මහත්මිය , ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා , ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මොහොම්මදු තාහීර් මොහොම්මදු ෂාබීර් මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජයන්ත හේරත් මහතා , ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි .ඒ.බංඩාර මැණිකා මහත්මිය , ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## V.කඩ කාමර අයිතිය මාරු කිරීම (C-24 දරණ කඩ කාමරය)

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

මඩිගේ අනුක්කන ,සුනන්දපුර පදිංචි එම්.යූ.එල්.රුකියා බීබි යන අය විසින් බදු ලබාගෙන ඇති පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් C-24 දරණ කඩ කාමරය ගිරාතලාන දකුණ,හෙට්ටිපොල ලිපිනයේ පදිංචි ඩබ්.එන්.පී.එම්.ඉන්දික ධර්මප්‍රිය යන අය වෙත,කඩ කාමර අයිතිය මාරු කර දෙන මෙන් එම්.යූ.එල්.රුකියා බීබි යන අය විසින් ලිපියක් අද දින සභාවට ඉදිරිපත් කර තිබෙනවා.ඒ අනුව C-24 දරණ කඩ කාමරය චක්‍රලේඛන ප්‍රකාරව විධිමත් ගාස්තු අය කර ඩබ්.එන්.පී.එම්. ඉන්දික ධර්මප්‍රිය යන අය වෙත කඩ කාමර අයිතිය මාරු කිරීම සඳහා යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>**

**"කඩ කාමර අයිතිය මාරු කිරීම (C-24 දරණ කඩ කාමරය)"** යෝජනාව සම්බන්ධව වැඩිදුරටත් තොරතුරු සොයා බලා සභා සම්මුතියක් ලබා ගැනීම සඳහා 2022 ජුනි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා.</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

**"කඩ කාමර අයිතිය මාරු කිරීම (C-24 දරණ කඩ කාමරය)"** යෝජනාව සම්බන්ධව වැඩිදුරටත් තොරතුරු සොයා බලා සභා සම්මුතියක් ලබා ගැනීම සඳහා 2022 ජුනි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම සුදු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව "කඩ කාමර අයිතිය මාරු කිරීම (C-24 දරණ කඩ කාමරය)" යෝජනාව සම්බන්ධව වැඩිදුරටත් තොරතුරු සොයා බලා සභා සම්මුතියක් ලබා ගැනීම සඳහා 2022 ජුනි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## VI.කඩ කාමර අයිතිය මාරු කිරීම (C- 22 දරණ කඩ කාමරය)

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් C-22 දරණ කඩ කාමරය බදු ලබා ගෙන සිටි දමුනාවත්ත,විල්බාගෙදර,බණ්ඩාරකොස්වත්ත පදිංචි ආර්.එම් සොහොදිරාල යන අය මිය ගොස් ඇති බැවින්,එම අයගේ පුත්‍රයා වන දමුනාවත්ත,විල්බාගෙදර,බණ්ඩාරකොස්වත්ත පදිංචි ආර්.එම්.තිලකරත්න බණ්ඩාර යන අය වෙත,කඩ කාමර අයිතිය මාරු කර දෙන මෙන් ආර්.එම්.තිලකරත්න බණ්ඩාර අය විසින් ලිපියක් අද දින සභාවට ඉදිරිපත් කර තිබෙනවා.ඒ අනුව චක්‍රලේඛන ප්‍රකාරව ආර්.එම්.තිලකරත්න බණ්ඩාර යන අය වෙත C-22 දරණ කඩ කාමරයේ අයිතිය මාරු කිරීම සඳහා යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් C-22 දරණ කඩ කාමරය බදු ලබා ගෙන සිටි දමුනාවත්ත,විල්බාගෙදර,බණ්ඩාරකොස්වත්ත පදිංචි ආර්.එම් සොහොදිරාල යන අය මිය ගොස් ඇති බැවින්,එම අයගේ පුත්‍රයා වන දමුනාවත්ත,විල්බාගෙදර,බණ්ඩාරකොස්වත්ත පදිංචි ආර්.එම්.තිලකරත්න බණ්ඩාර යන අය වෙත චක්‍රලේඛන ප්‍රකාරව C-22 දරණ කඩ කාමරයේ අයිතිය මාරු කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා - (ශ්‍රී.ල.මු.කො.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් C-22 දරණ කඩ කාමරය බදු ලබා ගෙන සිටි දමුනාවත්ත,විල්බාගෙදර,බණ්ඩාරකොස්වත්ත පදිංචි ආර්.එම් සොහොදිරාල යන අය මිය ගොස් ඇති බැවින්,එම අයගේ පුත්‍රයා වන දමුනාවත්ත,විල්බාගෙදර,බණ්ඩාරකොස්වත්ත පදිංචි ආර්.එම්.තිලකරත්න බණ්ඩාර යන අය වෙත චක්‍රලේඛන ප්‍රකාරව C-22 දරණ කඩ කාමරයේ අයිතිය මාරු කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් C-22 දරණ කඩ කාමරය බදු ලබා ගෙන සිටි දමුනාවත්ත,විල්බාගෙදර,බණ්ඩාරකොස්වත්ත පදිංචි ආර්.එම් සොහොදිරාල යන අය මිය ගොස් ඇති බැවින්,එම අයගේ පුත්‍රයා වන දමුනාවත්ත,විල්බාගෙදර,බණ්ඩාරකොස්වත්ත පදිංචි ආර්.එම්.තිලකරත්න**

**බණ්ඩාර යන අය වෙත චක්‍රලේඛන ප්‍රකාරව C-22 දරණ කඩ කාමරයේ අයිතිය මාරු කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## VII. ගිව්සුම් පදනම මත රියදුරෙකු බඳවා ගැනීම.

ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා

PE-8363 දරණ මාගේ නිල රථය සඳහා ගිවිසුම් පදනම මත රියදුරෙකු වශයෙන් බඳවාගෙන සිටි එස්.ඒ.අශෝක රණසිංහ මහතා දිගින් දිගටම නොදන්වා සේවයට නොපැමිණීම හේතුවෙන්,එම අය සේවයට බඳවා ගැනීමේ ගිවිසුම අවලංගු කර,ඔහු වෙනුවට පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව ගිවිසුම් පදනම මත රියදුරෙකු බඳවා ගැනීමට සහා අනුමැතිය ලබා දෙන ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ. නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)

PE-8363 දරණ ගරු සභාපතිතුමාගේ නිල රථය සඳහා ගිවිසුම් පදනම මත රියදුරෙකු වශයෙන් බඳවාගෙන සිටි එස්.ඒ.අශෝක රණසිංහ මහතා දිගින් දිගටම නොදන්වා සේවයට නොපැමිණීම හේතුවෙන්,එම අය සේවයට බඳවා ගැනීමේ ගිවිසුම අවලංගු කර,ඔහු වෙනුවට පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව ගිවිසුම් පදනම මත රියදුරෙකු බඳවා ගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

ගරු උප සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා

එම යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා

PE-8363 දරණ ගරු සභාපතිතුමාගේ නිල රථය සඳහා ගිවිසුම් පදනම මත රියදුරෙකු වශයෙන් බඳවාගෙන සිටි එස්.ඒ.අශෝක රණසිංහ මහතා දිගින් දිගටම නොදන්වා සේවයට නොපැමිණීම හේතුවෙන්,එම අය සේවයට බඳවා ගැනීමේ ගිවිසුම අවලංගු කර,ඔහු වෙනුවට පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව ගිවිසුම් පදනම මත රියදුරෙකු බඳවා ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව PE-8363 දරණ ගරු සභාපතිතුමාගේ නිල රථය සඳහා ගිවිසුම් පදනම මත රියදුරෙකු වශයෙන් බඳවාගෙන සිටි එස්.ඒ.අශෝක රණසිංහ මහතා දිගින් දිගටම නොදන්වා සේවයට නොපැමිණීම හේතුවෙන්,එම අය සේවයට බඳවා ගැනීමේ ගිවිසුම අවලංගු කර,ඔහු වෙනුවට පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව ගිවිසුම් පදනම මත රියදුරෙකු බඳවා ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## VIII. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතාගේ ක්‍රියාකලාපය දැඩි ලෙස හෙලා දැකීම.

ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතාගේ ක්‍රියාකලාපය දැඩි ලෙස හෙලා දකිමින් ගරු සභාපතිතුමා හා ලේකම්තුමා වෙත ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලය විසින් 2022.04.28 දිනැතිව ගොනු කරන ලද පෙත්සම ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

කාර්ය මණ්ඩලය අපට පෙත්සමක් ඉදිරිපත් කරලා තියනවා.මම ඒක සභාගත කලා.මේ වගේ දෙයක් දිගින් දිගටම ගෙනියන්න එපා.ආයතන ප්‍රධානි හැටියට මම බොහොම නිහතමානී ඉල්ලීමක් එසේම අවවාදයක් දෙනවා.අපි දෙපාර්ශවය ඇතුලත ගැටුමක් ඇති වුනොත් මේක පඩුවස්නුවර ජනතාවටත් මේ ආයතනයටත් බලපානවා.අපි සාමාන්‍ය පෘථග්ජන මිනිස්සු.අපි අතින් අඩුපාඩු වැරදි සිදුවෙන්න පුළුවන්. එහෙම නෙවෙයි අපි මනුෂ්‍ය නොවෙයි.දෙවියෝ වෙන්න ඕනි.අඩුපාඩු සිදුවීම මනුෂ්‍ය ගතියක්, සමාව දීම දේව ගතියක්.ඔබතුමාගේ ක්‍රියාකලාපය පිළිබඳව කාර්ය මණ්ඩලයට කනගාටුව ප්‍රකාශ කරනවා.අපි ක්ෂණිකව ගන්න තීන්දු බොහොම භයානකයි.දේශපාලනය කරන අය විදියට තීරණ ගනිද්දි බුද්ධිමත් වෙන්න ඕනි. අපි මිනිසුන්ගේ ඕන එපා කම් අහන්න ඕනි.අඩුපාඩු තියනවා නම් පෙන්වලා දෙන්න ඕනි.ඒ නිසා මම කියන්නේ බොහොම කාරුණිකව,මේ සියළු මන්ත්‍රීවරු මගේ හිතවත් මන්ත්‍රීවරු.ඒ වගේම ඔබතුමන්ලා මගේ හිතවත් නිලධාරීන් කාර්ය මණ්ඩලයේ අය ඔබතුමන්ලා දෙපාර්ශවය අතර මොනම අවස්ථාවකවත් ගැටුමක් ඇතිකරගන්න එපා.ගැටුමක් ඇතිවුනානම් ඒක නිරාකරණය කරගන්න ක්‍රමවේදයක් තියනවා.ඒ නිසා එවැනි අවස්ථාවල කලබල නොවී ආවේගශීලිව කටයුතු නොකර බොහොම සාමකාමීව කටයුතු කරන්න.යන්ත්‍රසූත්‍ර කියන ඒවා කැඩෙනවා,ඒ ගැන බුද්ධිමත්ව සිතිය යුතුයි.ගරු උප සභාපතිතුමා ඇතුළු සියළු මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය මේවා අමතක කරලා වැඩ කරමු.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>**

කාර්යාලයේ නිලධාරීන් එකසිය විසි ගාණක් මේක අත්සන් කරනවා.සාමාන්‍යයෙන් මෙහෙම අත්සන් ලේඛනයක් ගන්න බෑ.අපේ පක්ෂයේ වුනත්, කණ්ඩායම් නායකයා වුනත් මෙතුමා කරපු වැඩේ වැරදියි. කාර්යාල නිලධාරීන් හොරකම්, දූෂණ, වංචා නැති හොඳ නිලධාරීන් පිරිසක්.මේ මන්ත්‍රීතුමා ආවේගශීලී පුද්ගලයෙක්.ආවේගශීලී වෙලා කටයුතු කරන්න බෑ.කථා බහ කරලා විසඳගන්න ඕන.මේ වගේ අවස්ථාවලදී රියදුරුට පුළුවන්නම් ඒක හදාගන්න මොබයිල් ගේන්න අවශ්‍ය වෙන්නේ නැහැ.ගරු සභාපතිතුමා අපහසුතාවයට පත්කරන්න එපා.මං මේ සම්බන්ධව කථා කලේ සේවකයෝ වෙනුවෙන් හා අපේ පක්ෂයට පහරවදින නිසා.සියලුම නිලධාරීන්ගේ හා සේවකයින්ගේ සහාය අපිට අවශ්‍යයි.සියලු සාර්ථකව විසඳෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

**<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>**

ගරු සභාපතිතුමණි,යන්ත්‍ර සූත්‍ර කියන ඒවා කැඩෙනවා තමයි.අපි නම් ඒක හදලා එදා දවස වැඩ කරන්න පුළුවන්නම් වැඩ කරනවා.නැත්නම් යාබද නිවසක හරි දානවා.

ඒ විදයට තමයි අපි කාර්ය මණ්ඩලයත් එක්ක වැඩ කරන්නේ.ඔබතුමා මෝටර් ග්‍රේඩරය ඉදිරියට මොටර් සයිකලය දාලා හරස් කලා කියලා තමයි කියන්නේ.මේ මිනිසුන් එක්ක ගැටුම් ඇති කරගන්න එපා.එහෙම වුනොත් අපි තවත් හැල්ලුවට ලක්වෙනවා.වසර ගණනාවක් පුරා අපිත් එක්ක මේ සියලු දෙනාම මිත්‍රශීලිව කටයුතු කරනවා.ඔබතුමා කල ක්‍රියාව අපි කණ්ඩායමක් විදියට කිසිසේත් අනුමත කරන්නේ නෑ.ඒ ක්‍රියා කලාපය තරයේ හෙලා දකිනවා කියලා කාර්ය මණ්ඩලයට මතක් කරනවා.කාර්ය මණ්ඩලය සමඟ නිරතුරව සිටිනවා.ආදායම් පරීක්ෂක මහත්වරු ගිනි අව්වේ ගිහින් මහන්සි වෙලා මේ සභාවට ආදායම් එකතු කරන්නේ.ඒ ආදායම් වලින් තමයි අපි ගම්වල වැඩ කරන්නේ.ඒ නිසා මේ නිලධාරීන්ට අපි ගරු කරන්න ඕන.ඉදිරියටත් මෙවැනි දේට ඔබතුමන්ලා කලකිරෙන්න එපා.මොකක් හරි ප්‍රශ්නයක් වුනොත් අපි ඔබතුමන්ලා එක්ක ඉන්නවා. ඔබතුමන්ලා සමථයකට එන්න මේක දුරදිග ගෙනියන්න එපා.මින් ඉදිරියට මේ වගේ දෙයක් නොවෙන්න කණ්ඩායමක් විදියට එකමුතුව ඉන්න.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)</u>**

ගරු සභාපතිතුමණි,වාහනයක් ගත්තාම කැඩෙනවා තමා.ඒක කාටවත් වළක්වන්න බෑ.මේ වගේ වෙලාවක ඔබතුමා ඔච්චර පහත් තත්වයකට වැටෙයි කියලා අපි හිතුවේ නෑ.මේ මෝටර් ග්‍රේඩරය කැඩිලා හදන්න දානකොට ඔබතුමත් මේ මුදල් කමිටුවේ තමයි හිටියේ.ඔබතුමා අත්සන් කරලා තියෙනවා.මෝටර් ග්‍රේඩරය හැදුවා කියලා තාම සත පහක්වත් ගෙවලා නෑ.හැබැයි ඔබතුමා අපටත් හොරෙන් මෝටර් ග්‍රේඩරය අරන් ගිහිල්ලා කැඩුනට පස්සේ හදන්නත් නොදී යතුරු පැදියක් දාලා හරස් කරලා මේකට ගිනි තියනවා කියලා.ඔබතුමාට ඕන ඕන දේවල් කරන්න දෙන්න බෑ.මේවා රජයේ දේපල.පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා ඇතුලු නිලධාරීන් කිසිම කෙනෙකුට හානියක් කරන්නේ නෑ.සුහදශීලි ලෙසයි කටයුතු කරන්නේ.ඔබතුමාගේ ක්‍රියාකලාපය නිසයි මේ නිලධාරීන් එහෙම කටයුතු කරලා තියෙන්නේ.ගරු මන්ත්‍රීතුමා,ජනතාව මේ ජන වරම දීලා තිබෙන්නේ තාවකාලිකවයි.ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට ඔබතුමාගේ මේ ක්‍රියාව අපි පිළිකුලෙන් හෙලා දකිනවා.අපි සියලු දෙනාම එකතු වෙලා ගරු සභාපතිතුමාව පත් කර ගත්තේ.මිනිස්සු අතින් වැරදි වෙනවා.ඒකට සමාව දීලා අපි ඉදිරියට යමු.නිලධාරීන් ලෙස ඔබට කුමන අවස්ථාවක දී හෝ අහිතකර දෙයක් සිදු වෙනවා නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට අපි ඔබ සමඟ ඉන්නවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්.පයිසර් මහතා - (ශ්‍රී ල.මු.කො.)</u>**

ඇත්ත වශයෙන්ම කණගාටු දවසක් අද දිනය.මගේ දේශපාලන ඉතිහාසයේ මේ වගේ නාඩගමකට මුහුණ දීලා නෑ.මේ යන්ත්‍ර අපේ පැතිවලට ගෙනාවම අපි එතුමන්ලා එක්ක සුහදව වැඩ කරනවා.නමුත් මම හිතුවේ නෑ අපේ සුනිල් දිසානායක ගරු මන්ත්‍රීතුමා මෙවැනි අකටයුත්තක් කරයි කියලා.ඔබතුමා මගේ කල්‍යාණ මිත්‍රයෙක්.ඒ වගේ දෙයක් කරයි කියලා මං හිතුවේ නෑ.අපේ සභාවේ වාහනයකට ගිනි තියන්න හදලා,අපේ සභාවේ නිලධාරියෙකුට එසේ කතා කිරීම සුදුසු නෑ.මම ඔබතුමා එක්ක හිතෛශීව කටයුතු කරනවා.මෙවැනි වැඩවලට මම සම්පූර්ණයෙන්ම විරුද්ධයි.මේ නිලධාරි මණ්ඩලයත් මෙවැනි ඛේදවාචකයකට මුහුණ දීලා නැතුව ඇති.මම මේ හැමදෙනාගෙන්ම ඉල්ලා සිටිනවා මේක දුර දිග නොයා අපි කල්පනාකාරීව ඉදිරිගමන යන්න ඕනේ.මේ සභාවට කළු පැල්ලමක් තියන්න හොඳ නෑ.ඔබතුමාත් මින් ඉදිරියට මෙවැනි කඩාකප්පල්කාරී ක්‍රියා සිදුනොකර අපි සියලුදෙනා සමගිව වැඩ කරමු.පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ නම්බුනාමය ඉදිරියටත් රැකගනිමු.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා - (එ.ජා.ප.)</u>**

සුනිල් දිසානායක ගරු මන්ත්‍රීතුමා වරදක් සිදු කර තිබෙනවා.වචන වලින් තමයි මේ සිදුවීම සිදු වී තිබෙන්නේ.ඒ කෙසේ වෙතත් වරද කල කෙනාට ගහේ බැඳගෙන ගහනවාට වඩා එතුමාටත් ගරු සභාවේ මන්ත්‍රීවරයෙක් විදිහට පුංචි වචනයකින් හරි මේ නිලධාරීන්ට අදහසක් දක්වන්න අවස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය - (එ.ජා.ප.)</u>**

සුනිල් දිසානායක ගරු මන්ත්‍රීතුමා අතින් වැරද්දක් වෙන්න ඇති.ඒක ඇත්තටම දුරදිග ගෙනියන්න ඕන නෑ.අපේ සහෝදර කාර්ය මණ්ඩලයත් සමාව දෙනවා.මේ ආසන්න දිනයකදිත් සිදුවූ මෝටර් ග්‍රේඩරය සම්බන්ධ සිදුවීමක් ඇසින් දුටු සාක්ෂි තියෙනවා කියලා සභා වාර්තාවලත් එතුමාලා කියලා තියෙනවා.ඒත් අපි මොනවත් ක්‍රියාමාර්ගයක් නොගෙන සමාව දුන්නා.අපේ සභාවේ පක්ෂ විපක්ෂ භේදයක් නෑ.අපි වාද විවාද කරන්නෑ.අපි අදහස් දක්වනවා විතරයි.එනිසා මේ සියල්ල මෙතනින් අමතක කරමු කියලා කියනවා. සුනිල් දිසානායක ගරු මන්ත්‍රීතුමාටත් අදහස් දක්වන්න කාලයක් ලබා දෙමු.වරදක් වුණා නම් සමාව දීලා ඒක අමතක කරන්න කියලා කාර්යය මණ්ඩලයෙන් ඉල්ලා සිටිනවා.අපි ඒ කොට්ඨාසයේ සංවර්ධන වැඩ කටයුතු කරමු.

**<u>ගරු සභාපති බී.එම්. ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු මන්ත්‍රීවරුණි, මෝටර් ග්‍රේඩරය සම්බන්ධ ඒ සිදුවීමට කාර්යය මණ්ඩලයේ වරදක් නෑ.එතන දී මට වගකීමක් තිබෙනවා අපේ දේපල ආරක්ෂා කරන්න.ඒක වැරදි විදිහට අර්ථකතනය කරන්න එපා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>**

ගරු සභාපතිතුමණි,මේ සභාවේ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ඔබතුමාට ලැබී තිබෙනවා.මේ සභාවේ ආණ්ඩු පක්ෂයක් බවට අපි පත් වුණා.ගරු සභාපතිතුමා ඇතුළු පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ අනන්‍යතාවය රැක ගැනීමට අපටත් වගකීමක් තියෙනවා.ඒ වගේම ලේකම්තුමා ඇතුළු සමස්ත කාර්යය මණ්ඩලයේ අනන්‍යතාවය රැක ගැනීමටත් අපිට වගකීමක් තිබෙනවා.මේ සිදුවීමේදී මේ නිලධාරීන්ට එහෙම කතා කරන්න අපට අයිතියක් නෑ.යම්කිසි සිද්ධියක් වුනා නම්,ගරු සභාපතිතුමා,ලේකම්තුමා දැනුවත් කරලා විෂයභාර නිලධාරියාට එන්න කියලා මේ වාහනේ සභාවට ගිහින් දාන්න කියලා ඔබතුමා සංවරව හැසිරුණානම් අද මේ සභාවට මේ නිලධාරීන් එන්නේ නෑ.ඔබතුමාටත් අවස්ථාව තියෙනවා අද දින මාසික මහා සභා රැස්වීමේදී ඒ ගැන ඉදිරිපත් කරන්න.අපි අපේ ගෞරවය තියාගෙන වැඩ කරන්න ඕන.අපි සභාව සතු දේපලවලට වග කියන්න ඕනා.මේ නිලධාරීන් අපහසුතාවයට පත් කරන්න එපා කියලා සුනිල් දිසානායක ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)</u>**

මේ මෝටර් ග්‍රේඩරය නඩත්තු කරන තත්ත්වයේ තියෙන්නේ.මේ නිලධාරීන් හා මන්ත්‍රීවරුන් ගහට පොත්ත වගේ තමයි ඉන්න ඕනේ. ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා සමගි ජන බලවේගයේ නායකයා හැටියටත්,ගරු මන්ත්‍රීවරයෙක් හැටියටත් එතුමාට වගකීමක් තිබෙනවා ඉවසීමෙන් කටයුතු කරන්න.අපි සභාවේ දේපල වලට වග කියන්න ඕනා.මේ සම්බන්ධව අපේ විරෝධය පල කරනවා.අපි සියලු දෙනාම සමගිව කටයුතු කරන්න ඕනා.සියලු නිලධාරීන්ගෙන් ඉල්ලීමක් කරනවා මේ සිද්ධිය ඉදිරියට ගෙනියන්න එපා කියලා.මේ සභාවේ අසාධාරණයක් සිදු වෙනවා නම් ඒ හැම වෙලාවේම අපි නිලධාරීන් එක්ක ඉන්නවා.මුදල් කමිටුවේ මේවා අනුමත කරන කොට ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා ඒ මුදල් කමිටු වල හිටියා.අපි මේ සම්බන්ධයෙන් කණගාටු වෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)</u>**

ගරු සභාපතිතුමණි,මං ඉල්ලීමක් කරනවා මෝටර් ග්‍රේඩරයේ රියදුරු මහතා කැඳවන්න කියලා.මං සත්‍යතාවය තවදුරටත් පැහැදිලි කරන්නම්.මම 2004 මේ සභාවට අඩිය තිබ්බේ.කිසිම නිලධාරියෙක් එක්ක මං ගැටුමක් ඇති කරගෙන නෑ.මෙම රියදුරු මහතාට හිත රිදෙන වචනයක් කීවේ නෑ. මේ මෝටර් ග්‍රේඩරය හදද්දි කොන්දේසියක් තිබුණා කැඩුණාම එම ස්ථානයට මොබයිල් එක ගේන්න හා මාස 06ක හෝ වසරක වගකීමක් ඒ ආයතනයෙන් ලබා දෙන්න කියලා.මං මෝටර් ග්‍රේඩරය අරන් ගියේ යාන්ත්‍රික ඉංජිනේරුතුමා පරීක්ෂා කරලා සුදුසු තත්වයේ තියෙනවා කීවාට පස්සේ.පළමු දවසේ රියදුරු මහතා වාහනේට නැගලා ස්ටාර්ට් කරනකොට ඒකේ හයිඩ්‍රොලික් පද්ධතියේ දෝෂයක් ඇති වුනා.හැබැයි මම ඒ ස්ථානයටවත් ගියේ නෑ.එතුමා පැයකට දෙකකට වඩා උත්සාහ දැරුවා.මං පැත්ත පලාතටවත් ගියේ නෑ.ඒ අදාල ආයතනයටත් එතුමා කතා කලා.දෙවැනි දවසේත් මෝටර් ග්‍රේඩරයෙන් වැඩ කරන්න බැරි උනා.රියදුරු මහතා බොක්ස්

එක ඇරලා බැලුවා.ඒත් මට ආරංචි වුණේ මම අතවත් තියන්න දුන්නෑ කියලා.එතුමා සෑහෙන වේලාවක් උත්සාහා දැරුවා. හැබැයි මම කීවා ඔබතුමාට හදන්න පුළුවන්නම් ගැරේජ් එකට දාන්න ඕන නෑ,ඔබතුමා මේක නවත්වන්න කියලා.ඒත් හදන්න බැරි වුනා. ඔන්න ඕකයි පළවෙනි කාරණේ.මම එතුමාට නෙවෙයි ගරු සභාපතිතුමා ඔබතුමාටයි කීවේ මිනිස්සු ගිනි තියයි කියලා.නිලධාරීන්ට කීවේ නෑ.මං කිසිම තර්ජනයක් කළේ නෑ.මගේ ඉල්ලීම වුණේ මොබයිල් එක ගේනත් මේක හදන්න කියලා.ගිනි තියනවානම් මගේ බයිසිකලේ එතනට දාන්නේ නෑ.එතන මහා ලොකු සිද්ධියක් වුනේ නෑ.අහිංසක මිනිස්සු මේවාට මුදල් ගෙවන්නේ.මම මහා ලොකු විශ්මකර්ම වැඩක් කලේ නෑ.හැබැයි මගේ ඒ කතාවේ ආවේගශීලිතාවයක් තිබුණා.ඒ මගේ ඉල්ලීම ඉෂ්ට කරගන්න තමයි ආවේගශීලි වුණේ.ඔන්න ඕකයි ඇත්ත කතාව.මගෙන් කිසිම වෙලාවක නිලධාරියෙකුට අකටයුත්තක් හෝ වරදක් වෙලා නෑ.එදා එහෙම දෙයක් වුණා නම් මම කණගාටු වෙනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා-(එ.ජ.නි.ස.)</u>

මේ සම්බන්ධව අදාල නිළධාරීන්ගෙන් කරුණු විමසා බලා තව දුරටත් දැනුවත් වීම සඳහා මෙම මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්. ධර්මසේන බමුණුසිංහ මහතා</u>

මෙම මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා - (එ.ජා.ප.)</u>

මෙම කාරක සභා අවස්ථාව නැවත මහා සභාව බවට පත් කිරීම සුදුසු මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

සියලු ගරු මන්ත්‍රීවරු හා කාර්යය මණ්ඩලය සහයෝගයෙන් බොහොම සාමකාමීව කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

## 04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

## 05.යථා පරිදි කල් දී ඇති යෝජනා

## I.පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් මැනුම් කර ඇති මාර්ග සම්බන්ධව විරෝධතා කැඳවීම ගැසට් කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන අනුව මැනුම් කටයුතු කර ඇති මාර්ග 2157 ප්‍රාදේශීය සභා මාර්ග ලෙස ගැසට් කිරීමත්,එකී මාර්ග සඳහා විරෝධතා ඇත්නම් ගැසට් කරන දින සිට දින 30 ක් ඇතුලත සභාව වෙත ඉදිරිපත් කිරීමත් සුදුසු බවට මා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ජුනි මස මහා සභා වාරයට කල් තැබීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන අනුව මැනුම් කටයුතු කර ඇති මාර්ග 2157 ප්‍රාදේශීය සභා මාර්ග ලෙස ගැසට් කිරීමත්,එකී මාර්ග සඳහා විරෝධතා ඇත්නම් ගැසට් කරන දින සිට දින 30 ක් ඇතුලත සභාව වෙත ඉදිරිපත් කිරීමත් සුදුසු බවට මා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ජුනි මස මහා සභා වාරයට කල් තැබීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන අනුව මැනුම් කටයුතු කර ඇති මාර්ග 2157 ප්‍රාදේශීය සභා මාර්ග ලෙස ගැසට් කිරීමත්,එකී මාර්ග සඳහා විරෝධතා ඇත්නම් ගැසට් කරන දින සිට දින**

**30 ක් ඇතුලත සභාව වෙත ඉදිරිපත් කිරීමත් සුදුසු බවට මා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ජුනි මස මහා සභා වාරයට කල් තැබීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## II. පඩුවස්නුවර බල ප්‍රදේශයේ ජනතාව කහ වගාවේ නිරත වී පාඩු සිදු වී අසරණ තත්ත්වයට පත් වීම සම්බන්ධව.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර බල ප්‍රදේශයේ ජනතාව පසුගිය කන්නයේ කහ වගාවේ නිරත වී පාඩු සිදු වී අසරණ තත්ත්වයට පත් වීම සම්බන්ධව විශේෂ යෝජනාවක් ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා.එම යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය - (එ.ජා.ප.)</u>

පඩුවස්නුවර බල ප්‍රදේශයේ ජනතාව පසුගිය කන්නයේ කහ වගාවේ නිරත වී පාඩු සිදු වී අසරණ තත්ත්වයට පත් වීම සම්බන්ධව අදහස් දැක්වීම සඳහා විශේෂ යෝජනාවක් විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.අප ප්‍රදේශයට උද්ගත වී ඇති ප්‍රශ්නයක් නිසා අප පළාත් පාලන ආයතන සභිකයින් විදියට අපේ ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික තත්ත්වය පිළිබඳව සොයාබලා කටයුතු කිරීම අපගේ ආයතනයේ ප්‍රධාන වගකීමක් බව මම හිතනවා.ඒ නිසා තමා මම මේ යෝජනාව ගෙනාවේ.පසුගිය කාලයේ කහ හිඟතාවයක් ඇතිවුන නිසා අපේ ජනතාව බොහෝ ලෙස කහ වගා කිරීමට යෙදුණා. ඇත්තටම බොහෝ වියදමක් දරා ගෙන කහ වගාව සරුසාර කරගත්තට කහ අස්වනු ලබාගන්නා වෙලාවේ කහ කිලෝවක් රු.80.00 කටවත් දෙන්න නොහැකි වුනා. කහ ගොවියෝ බොහෝ අන්ත අසරණ තත්ත්වයකට පත් වුනා. මේකට ඇත්තටම හේතුව වන්නේ කහ ගලවන අවස්ථාවේ කහ පිටරටින් ආනයනය කිරීමයි. නමුත් ගොවියෝ මේ කන්නයේ දීත් කහ වගා කරා කරන්න දෙයක් නැති කමට.ඉතින් ඉදිරියේදී ඔවුන් අස්වනු නෙලන කාලයේ දී මේ වගේ තත්ත්වයක් ඇති නොවෙන්න අපි පළාත් පාලන ආයතනයක් විදියට වග බලාගත යුතුයි. අපිට තමයි මේ දුක් ගැනවිලි අපේ ජනතාව ඉදිරිපත් කරන්නේ.ඇත්තටම රජය මැදිහත් වී ක්‍රියාමාර්ග යෙදුවා නම් මෙවැනි තත්ත්වයක් නොවෙන්න ඉඩ තිබුනා. හැම වසමකටම රාජ්‍ය නිලධාරීන් 4 දෙනෙකු යොදවා සිටිනවා. ඔවුන් මඟින් කටයුතු යෙදුවා නම් මෙවැනි දෙයක් නොවෙන්න ඉඩ තිබුනා. අපේ සභාපතිතුමා කිව්වා කෘෂි කමිටුවකට පළාත් පාලන නියෝජිතවරුන් සම්බන්ධවෙලා හිටියට දැන් එවැනි අවස්ථාවක් නෑ.ගොවියාගේ ප්‍රශ්න ගැන කථාකරන්න තැනක් නෑ.ඉදිරියට මෙවැනි තත්ත්වයක් ඇති නොවෙන්න පළාත් පාලන නියෝජිතයින් මේ සඳහා අවධානය යොමුකරවන ලෙස මං සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.අපි දන්නවා 2020, 2021 වර්ෂවල අපේ රටේ ඒක පුද්ගල දළ ජාතික ආදායම සාමාන්‍යයෙන් ඩොලර් 4000ක් පමණ කියලා. එක පුද්ගලයෙක්ගේ දළ ජාතික ආදායම ලක්ෂ 12ක් වෙන්න ඕන. එක පවුලක 5 දෙනෙක් ඉන්නවා නම් ආදායම ලක්ෂ 60ක් විතර වෙනවා.පාලකයින් තෝරා පත් කර ගද්දී අපි මීට වඩා කල්පනාකාරී වෙන්න ඕන.අපේ රටේ ජනගහනයෙන් 83%ක් ගැමි ජනගහනය සිටින්නේ.මොන පාලකයා වුනත් ගම දියුණු කරන්න නෙවෙයි බැලුවේ.නගර සංවර්ධනය කරන්න. තමන් ජීවත්වන ආශ්‍රිත නගරය දියුණු කරනවා. ඒ විදියට තමා පාලකයින් ක්‍රියා කලේ අපේ අවාසනාවකට හෝ හිටපු එක ජනාධිපතිවරයෙක් අකාලයේ මියැදුණා.ඔහු ගැමි ජනතාව වෙනුවෙන් කටයුතු සිදු කළා. උදාගම් ව්‍යාපාර යටතේ ගොවි උපකරණ ලබාදුන්නා.අපේ ගැමි ජනතාව සමෘද්ධිමත් කරන්න හිටපු ඒ නායකතුමා රුදුරු බෝම්බයකින් මිය ගියා.අපි රටක් වශයෙන් දියුණු වෙනවා නම් ජනතාවගේ පැත්තෙන් 100%ක් වගේම කර්මාන්තය අංශය 60%ක් වත් දියුණු කරන්න ඕනි.ඒ ගැන හිතලා තමයි එදා එතුමා කම්හල් 200 ක වැඩසටහනක් ආරම්භ කරලා අපේ රටේ ඇඟලුම් කර්මාන්තය තුලින් 80% ක අපනයන ආදායම එක මාසයකින් වැඩි කරන්න එතුමාට හැකියාව ලැබුණා.ඒ වගේ ප්‍රතිපත්ති තියෙන නායකයෙක් ඉක්මනට බිහිවෙන්න කියලා මං ප්‍රාර්ථනා කරනවා. මේ අවුරුදු දෙකේ අපේ රටට මෙහෙම දෙයක් වුනේ පාලකයින් හොඳින් වැඩකලේ නැති නිසා.ඒ අය වටේ ඉන්න අය විතරක් සැපවත් වුණාම ඇති කියලායි ඔවුන් හිතුවේ.ජනතාව ගැන ඔවුන් හිතුවේ නෑ.ඉක්මනින් අපේ රට යථා තත්ත්වයට පත්වෙන්න කියලා මං ප්‍රාර්ථනා කරනවා.අපේ කෘෂිකාර්මික කටයුතු යථා තත්ත්වයට පත් කරන්න පළාත් පාලන ආයතනයක් වශයෙන් ගත යුතු ක්‍රියාමාර්ග ගන්න කියලා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් මහතා - (එ.ජ.නි.ස.)</u>

නිශාන්ති ගරු මන්ත්‍රීතුමිය ගෙනාපු යෝජනාවේ ආණ්ඩුවට චෝදනාවක් තියනවා.හැබැයි ලංකාවේ කහ පරිභෝජනය වර්ෂයකට මෙට්‍රික් ටොන් 5500යි. එතකොට 2019 කහ මෙරටට ආනයනය කරලා තියනවා මෙට්‍රික් ටොන් 5288ක් පමණ. මේක කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා තමයි කියන්නේ. මේ

ගැටළුව නිසා 2019 හෙක්ටයාර් 923ක් පමණ වගා කලා.මෙයින් කෘෂිකර්මාන්ත දෙපාර්තමේන්තුව අපේක්ෂා කරා මෙට්‍රික් ටොන් 9500ක්.2020 වනවිට කහ අතිරික්තය නිසා කෘෂිකර්මාන්ත දෙපාර්තමේන්තුව අපේක්ෂා කරා හෙක්ටයාර් 1500ක වගා කරන්න.ඒ අනුව වගාව තුලින් අපේක්ෂා කර මෙට්‍රික් ටොන් 25000ක්. නමුත් මේක අපනයනය කරන්න සැලසුමක් තිබුණේ නෑ.2021 වනවිට මෙට්‍රික් ටොන් 4000ක් වගා කරන්න සැලසුම් කලා.ඒ අනුව දැන් ලංකාව තුල කහ අතිරික්තයක් තියනවා. ඒ අනුව තමා දැන් කහ කිලෝව 80, 100 වෙලා තියන්නේ.කහ වලට වී වලට වගේ මිලක් නොමැති නිසා ගබඩා කරගෙන කහ ආනයනය කරන්න පුද්ගලයෝ සිටියට අපනයනය කරන්න වැඩපිලිවෙලක් තිබුනේ නෑ. 2021 වනවිට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට මේ සම්බන්ධව සැලසුමක් හදාගන්න බැරිවුනා.රටේ තිබුණ අයහපත් ආර්ථික රටාව නිසා කහ ගොවීන්ට බලපෑවා.මේ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට, ගොවිජන සේවා මධ්‍යස්ථානවලට වගකීමක් තියනවා.මං දකිනවා සමහර ප්‍රදේශවල සුළු අපනයන බෝග ගම්මාන වැඩපිලිවෙලක් හදලා තියනවා.නමුත් රජයේ මේවායේ පසු විපරමක් නොමැති කමත් බලපෑවා.ලංකාවේ කහ නිෂ්පාදන මිලදී අරගෙන අපනයන කරන තත්ත්වයට ගෙනවා නම් රට තුල මෙතරම් ලොකු අර්බුදයක් ඇතිවන්නේ නැහැ.මේකට සැලසුම් හදාගන්න කෘෂිකර්මාන්ත දෙපාර්තමේන්තුව, අපනයන බෝග දෙපාර්තමේන්තුව ආදි ආයතන වලට හැකියාව ලැබේවා. මෙවැනි වගාවන් සිදු කරන ගොවියන්ගේ අස්වැන්නට හොඳ මිලක් ලැබේවා.බලධාරීන් මේවාට හොඳ වැඩපිළිවෙළක් යොදන්න අවශ්‍යයි.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

අපර්ණ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා අපට මේ පිළිබඳ හොඳ අවබෝධයක් ලබා දුන්නට.ඇත්තටම සැපයුම වැඩිනම් ඉල්ලුම අඩුනම් මිල තීරණය වන්නේ ඉල්ලුම සැපයුම මතයි. මෙතන ඇත්තටම වෙලා තියෙන්නේ ඉල්ලුම වැඩිවීමක් වීම. අපිට ඉදිරියට කෘෂිකර්මාන්ත දෙපාර්තමේන්තුවට දැනුවත් කරන්න පුළුවන් නම් හොඳයි.ගොවියෝ සැලසුමක් ඇතිව මේ දේවල් වගා කලානම්, කෘෂි නිලධාරි හරහා මේ දේවල් දැනුවත් කලා නම් අමාරුවේ වැටෙන්නේ නෑ.කෘෂි කර්මාන්ත දෙපාර්තමේන්තුව දැනුවත් කරලා රස් කරන යන්ත්‍රයක් ගෙනාවා නම් අපිට ගොවියට සාධාරණයක් ඉෂ්ඨ කරන්න තිබුණා.නරක් නොවන නිසා ගබඩා කරලා තියාගන්න තිබුණා.අපි ප්‍රාදේශීය නායකයෝ විදියට ලැජ්ජයි අපිට දේශපාලනය කරන්න.ඩීසල්, පෙට්‍රල් නෑ.අපි සමාජයට ආදර්ශයක් විදියට හිටියොත් අපිට සමාජය හදන්න පුළුවන්.

<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>

නිශාන්ති ගරු මන්ත්‍රීතුමිය කහ වගාකරන ගොවියෝ අසීරුතාවයකට පත්වීම ගැන යෝජනාවක් ඉදිරිපත් කරා.එතුමියගේ කතාවට විවේචනාත්මකව මම කතා කරන්නේ නෑ.විශේෂයෙන්ම 2019.11.16 දින ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අපේ රටේ ජනාධිපති බවට පත්වුනාට පසුව යම් වාහන ඇතුළුව අත්‍යවශ්‍ය නොවන හා අත්‍යවශ්‍ය වන මේ රටේ නිෂ්පාදනය කල හැකි නිෂ්පාදන 500 ගාණක් ආනයනය කිරීම නැවැත්තුවා. ඒ අතරට කහ කුඩුත් ඇතුලත් වෙලා තිබුණා.නමුත් සමහර පුද්ගලයන් වංචා සහගතව එම භාණ්ඩ මෙරටට රැගෙන ඒමට කටයුතු කලා. ඒ අනුව කහත් මෙරටට අනවසරයෙන් ගෙන ඒමේ දී නාවික හමුදාව විසින් භාරයට ගෙන තිබුණා. 2019 ට පෙර කහ කිලෝවකට මිල රු.15ක්, 20ක්, 25ක් පමණ තමා තිබුණේ.එම නිසා ගොවියෝ කහ වගාකිරීම අත්හැර දමා තිබුණේ. තවද මීට කලින් තිබූ සෑම රජයක්ම කහ ආනයනය කලා. ඒ නිසා ගොවියෝ කහ වගාකලේ නැහැ.ඒ කාලේ කහ වලට පොඩි මුදලක් ලැබුණේ. ඊට පසුව ආනයනය නතර කලාට පසුව කහ හිඟයක් ඇතිවුනා.ඊට පසුව තමා කහ කිලෝවක් රු.800.00කට වගේ අලෙවි වුනේ. ඉන් පසුව තමයි සෑම ගෘහස්ථයකම අනිවාර්යයෙන්ම කහ පැල 3,4ක් වගා කරන්න පටන්ගත්තා. සෑම ගොවියෙක්ම කහ වගා කරන්න පටන්ගත්තා.ඒ නිසා විශාල වශයෙන් කහ අතිරික්තයක් ඇතිවුනා. ඒ අතිරික්තය තුල කහ මිල බැස්සා.මාත් මේ සම්බන්ධව දන්න පුද්ගලයෙක් සමඟ කථාකරලා කීවා මෙයට වැඩපිළිවෙලක් සකසන්න කියලා.මේ අතිරික්තය නැතිකරන්න පිටරටවල්වලට අපනයනය කරන්න පුළුවන් කියලා.නමුත් සෑම රටකම කහ පරිභෝජනය කරන්නේ නෑ.කහ පරිභෝජනය කරන සෑම රටක්ම කහ මහ පරිමානයෙන් වගා කරලා තියෙන්නේ කියලා එතුමා පැවසුවා.අපි දැනගන්න ඕන කෘෂිකර්මාන්ත දෙපාර්තමේන්තුව හරහා මේ රටට වාර්ෂිකව අවශ්‍ය ප්‍රමාණයට පමණක් කහ වගාකරන්න කටයුතු කරන්න ඕනි කියලා.කෘෂි දෙපාර්තමේන්තු හෝ කෘෂි නිලධාරි හරහා හෝ කහ පමණක් නොව තවත් කුළු බඩු රාශියක් තියනවා,පළාත් මට්ටමින් හරි ඒවාත් වගාකරන්න කටයුතු සලස්වන්න ඕන.නමුත් මේවාගේ කිසිඳු පසු විපරමක් නෑ.කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ලොකු කාර්යභාරයක් තියනවා මහජනතාව උනන්දු කරලා මේ කටයුතු සිදු කරන්න.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ගරු මන්ත්‍රීවරුණි,කෘෂිකර්ම කමිටුවට අපි ඉස්සර සහභාගී වුනා.දැන් අපිට කැඳවීමක් නෑ.නමුත් ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයා සැම කෙනෙක් සමඟම ඉන්නවා.නිශාන්ති ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාව සමඟ මම එකඟ වෙනවා.හැබැයි මේ තත්ත්වය මේ ඊයේ පෙරේදා මේ ආණ්ඩුවෙන් සිදු වුණ දේවල් නෙවෙයි.අපිට තිබුණා සංවෘත ආර්ථික ප්‍රතිපත්තියක්.ඒක වෙනුවට විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් ගෙනාවා.ඒකේ අහිතකර ප්‍රතිපල තමයි අපි විඳින්නේ.

පඬුවස්නුවර බල ප්‍රදේශයේ ජනතාව පසුගිය කන්නයේ කහ වගාවේ නිරත වී පාඩු සිදු වී අසරණ තත්ත්වයට පත් වීම සම්බන්ධව අදහස් දැක්වීම සුදුසු බවට ගෙන ආ විශේෂ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඬුවස්නුවර බල ප්‍රදේශයේ ජනතාව පසුගිය කන්නයේ කහ වගාවේ නිරත වී පාඩු සිදු වී අසරණ තත්ත්වයට පත් වීම සම්බන්ධව අදහස් දැක්වීම සුදුසු බවට ගෙන ආ විශේෂ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## III.නව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සුභ පැතීම.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

නව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සුභ පැතීම සඳහා විශේෂ යෝජනාවක් ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා.එම යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා - (එ.ජා.ප.)**

නව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සුභ පැතීම සඳහා විශේෂ යෝජනාවක් ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.නව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සුබ පැතීමට අවස්ථාව ලබාදීම ගැන සභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා.මේ අවස්ථාවේ රට ගොඩ ගැනීමට සිටින පාර්ලිමේන්තුවේ සුවිශේෂීම පුද්ගලයා ඔහු.අපි විශ්වාස කරනවා එතුමා ජනතාවගේ සියලු ප්‍රශ්නවලට හැකි ඉක්මනින් විසඳුම් ලබා දෙයි කියලා.ඒ වගේම මේ රටේ ඇති වුණු ප්‍රකෝපකාරී සිද්ධීන්වලටත් එතුමා නිසි ක්‍රියාමාර්ග ගනියි කියලා බලාපොරොත්තු වෙනවා.එයට එතුමාට ශක්තිය ධෛර්ය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.එතුමාට සහයෝගය දෙන පක්ෂවල සියලු නායකයින්ට හා සියලු ගරු මන්ත්‍රීවරුන්ට අපේ ස්තූතිය පුද කරනවා.රට මුහුණ පා තිබෙන අභියෝග ජය ගැනීමට නව අගමැතිතුමා ප්‍රමුඛ ආණ්ඩුවට ශක්තිය ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.මම විශේෂ ඉල්ලීමක් කරනවා කතෝලික මන්ත්‍රීවරයෙක් වශයෙන්,පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් සාධාරණයක් ඉෂ්ට කරන්න කියලා.ගමේ ප්‍රශ්න අපි විසඳමු.පාට පක්ෂ භේදයකින් තොරව අපි එකතු වෙලා වැඩ කරමු.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය - (එ.ජා.ප.)**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)**

අපි අන්ත අසරණ වෙලා තියෙන වෙලාවක ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කල,පස් වතාවක් අගමැති බවට පත් වූ රනිල් වික්‍රමසිංහ මැතිතුමා හය වැනි වතාවටත් ශ්‍රී ලංකාවේ අගමැතිවරයා වශයෙන් පත් වීම ගැන මේ වෙලාවෙත් පත්වීම ගැන ප්‍රාදේශීය නායකයෙක් හැටියට මම සතුටු වෙනවා.එතුමාට සුභාශිංසන එකතු කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

මේ රට අද පත්වෙලා තියෙන තත්වයට 77න් පස්සේ බලයට පත්වුන හැමදෙනාම වග කියන්න ඕනා. ඒ වගේම අරගලකරුවන් කියනවා මේ අවස්ථාව තරුණයෙකුට දෙන්න කියලා.තරුණයෙකුට භාර දුන්නා නම් ඒහු අද කෙහොමද මේ රටට ඩොලර් ගේන්නේ.එහෙම නම් සමගි ජනබලවේගයේ හිටියා තරුණයෙක්.එතුමාට භාර ගන්න කීවා.භාර ගත්තේ නෑ.හේතුව අනිවාර්යයෙන් දන්නවා කරන්න බෑ කියලා.ඒ අයට ලෝකයක් සමඟ සම්බන්ධතා නෑ.වැඩිහිටියන්ට ගරු කිරීම අපි මෙතන දී වත් ඉගෙන ගන්න ඕන.රටක් විදියට ගත්ත හොඳම තීරණේ මේ.දැවෙන ප්‍රශ්න රාශියක් එක්ක අරාජික වෙලා තියෙන මේ රට එතුමා භාර ගත්තා.ඒ පිළිබඳව අපි සතුටු විය යුතුයි.එතුමාට ස්තූතිවන්ත විය යුතුයි.එතුමාට සුබ පතමු.පසුගිය වකවානුව තුල සිදු වූ සියලු දේට වග කියන්න ඕන මේ ගිනි අවුලපු මිනිස්සු.අර්බුදයක් තිබෙද්දී ඒ අර්බුදයෙන් ප්‍රයෝජන ගන්න ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු ඒ කණ්ඩායම මේකෙන් බොර දියේ මාළු බාන්න හැදුවා.වාහන වලට දේපල වලට ගිනි තිබ්බේ ඊරිසියාවට.මේ කරන වැඩ වලින් එතුන්ලාට 3% වත් නැති තත්ත්වයට පත් වෙනවා.මේ දේවල් වලට අනුබල දුන් සියලු දෙනාම මේවාට වග කිව යුතුයි.ඉදිරියේ දී නීතිය හොඳින් ක්‍රියාත්මක වෙයි.අපි මන්ත්‍රීවරු විදිහට සියලු දෙනාම එකතු වෙලා මේ වගේ වෙලාවක පක්ෂ භේදයකින් තොරව මේ රට ගොඩ ගන්න කටයුතු කරන්න පටන් ගමු.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා - (එ.ජ.නි.ස.)</u>**

මැයි 09 වෙනිදා වනවිට රටේ තිබුණු තත්ත්වය පුපුරා යන්නට කටයුතු සිදුවෙනකොට, අපේ රටට ලබාගෙන තිබූ ජාත්‍යන්තර ප්‍රසාදය අප්‍රසාදයක් වෙනකොට, මේ රටේ කීර්තිමත් දේශපාලන ඉතිහාසයකට හිමිකම් කියූ මහින්ද රාජපක්ෂ මහතාගේ නම ඇතුළු රාජපක්ෂවරුන්ගේ සියළු දේ විනාශ වෙලා මේ රටේ ශ්‍රේෂ්ඨ නමක් ඉතිහාසයේ ලියාගන්න තිබූ මහින්ද රාජපක්ෂ මැතිතුමාට ගෙදර යන්න වුණා.මෙවැනි මොහොතක රනිල් වික්‍රමසිංහ මහතාට නැවත අගමැතිකම නමැති කටු ඔටුන්න දාගන්න කොන්දක් එතුමාට තිබුණා.ඒ ගැන අපි ආඩම්බර වන්නේ මේ රට වැටෙන්න පුළුවන් අන්තිම තැනට වැටිලා මේ රටේ දේශපාලන දාරාවේ විපක්ෂ නායකතුමා තීන්දු තීරණ ගන්න පසුබට වෙද්දී රනිල් වික්‍රමසිංහ මහතා බය නැතිව මෙය භාර ගත්තා. ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සුභාශිංසන එතුමාට එකතු කරනවා.එතුමා ජාත්‍යන්තරයේ ඉන්නවා කියන්නේ එතුමා ඇත්තටම ගිවිසුම් වලට කැමතියි.හොඳ මුදල් ඇමතිවරයෙක් පත් කරගෙන සිටින මහ බැංකු අධිපතිවරයා යටතේ හොඳ නිලධාරී කණ්ඩායමක් මේ රටට ඕන.ජනතාවගේ අත්‍යවශ්‍ය බඩුවල මිල, ඖෂධ ගැටළුව ඇතුළු පවතින සියලු ප්‍රශ්න වලට සහන ලබා දීලා එතුමාට රට කරන්න පුළුවන් නම් හොඳයි.මොකද ජනතාව පීඩාවට පත්වෙලා ඉන්නේ.බහුතර ජනතාවට මේ රටේ දේශපාලනය තිත්ත වෙලා තිබෙන්නේ.පසුගිය දිනවල සිදු වූ සිදුවීමෙන් දේපල වලට හානි සිදු වීම සම්බන්ධව කණගාටු වෙනවා.ඒවා සම්බන්ධව නීතිය ක්‍රියාත්මක විය යුතුයි.හොඳ කැබිනට් මණ්ඩලයක් හදාගෙන මේ රට යථා තත්ත්ව යට ගන්න රනිල් වික්‍රමසිංහ මහතාට ශක්තිය ලැබෙන්න ඕන.එතුමාට සුභ පතනවා.දළදා හාමුදුරුවන්ගේ ආශීර්වාදය ලැබේවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා - (එ.ජා.ප.)</u>**

රනිල් වික්‍රමසිංහ මහතාගේ ආගමන පිළිබඳව අපි සතුටු වනවා.එතුමාට අපි සුබ පතනවා .එතුමා යමක් කරයි කියලා හිතනවා මේ රටට.තරංග ගරු මන්ත්‍රීතුමා කීවා වැඩිහිටි අයට අත්දැකීම් තිබෙනවා,ඒ රට කරනවා කියලා.පසුගිය කාලය පුරාවටම වැඩිහිටි අය කණ්ඩායමක් තමයි මේ රට කරගෙන ගියේ.හැබැයි ඉතිං ඒකේ ප්‍රතිපල අපිට තිබුණේ නෑ.ඩොලර් නෙවෙයි කළුගල් දාලා හරි මේ ජනතාවගේ සිතුම් පැතුම් පුරවන්න හැකිනම් එයයි විය යුත්තේ.අපි සියළු දෙනාම එකමුතු වෙලා මේ රට ගොඩ නගන්න එතුමාට සහයෝගය ලබාදෙමු.

**"කොළ කන්දට ගිනි තියලා විළඳ හොයනවද ඔහෙලා**
**බිත්තියේ ගැසූ පලා ඇඹුල යලි හොයනවා රස දැනිලා**
**මැණිකක් වටිනවා වුනාට කණයි ගන්නවද අහුලා**
**රනිල් මැතිඳු එනවා කියා පොහොට්ටුවත් දණ නමලා"**

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>**

රනිල් වික්‍රමසිංහ කියන චරිතය දිගු දැකිමක් තිබෙන චරිතයක්.මේ රජයට සිදු වුණේ කළමනාකාරීත්වයක් නැතිකම.ඉදිරියේ දී මාස තුනක් යනකම් මේ රටට බෙහෙත් එන්නේ නෑ.ගෑස්,ඉන්ධන ඇතුළු දේවල් වලට පෝලිම්.විදුලිය පැය 15 ක් වත් කපන්න වෙයි කියනවා.රටවල් ගණනාවක් අපිට උදව් කරන්න කැමතියි.රටේ නායකත්වය රාජපක්ෂ කියන නම් ඔතන තියෙනකම් ලෝකෙ කිසිම රටක් සල්ලි දෙන්නේ නෑ.මේ අර්බුද එක්ක මිනිස්සු කොහොම ජීවත්වෙනවද මන්දා.මේ වගේ වෙලාවක පත්වුණු රනිල් වික්‍රමසිංහ මහතාට දිගු ගමනක් යන්න ආශිර්වාද ලබා දෙනවා.

**<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>**

රනිල් වික්‍රමසිංහ මහතාට සුබ පතන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. ඒ වගේම කුමාරසේන මන්ත්‍රීතුමා කවි කියන්න හරි දක්ෂයි.ඔබතුමා කතා කළා මැණික ගැන.ඒ මැණික ඔබතුමාලගේ තියාගෙන තමා අත හැරියේ. ඒකට අපිට කරන්න දෙයක් නෑ.පසුගිය දින පනස් දෙකේ ආණ්ඩුව අවස්ථාවේ රනිල් වික්‍රමසිංහ මහතාට මේ රටේ අග්‍රාමාත්‍ය ධුරය භාරදෙන අවස්ථාවේ ඔබතුමන්ලා සුභ පැතීමේ යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාවේ අපේ මන්ත්‍රී කණ්ඩායම එළියට ගියා.නමුත් ඔබතුමන්ලා සමඟ එදත් මම ඒ අග්‍රාමාත්‍යතුමාට සුභ පැතුවා.රටට පත් වන රාජ්‍ය නායකයින් රට කරන්න ඕන. පහුගිය කාලේ ලොකු බල පෙරලියක් සිද්ධ වුණා.අපේ සංවිධායකතුමා ඇතුළු මන්ත්‍රීවරු කිහිප දෙනෙකුගේ නිවාස වලට ප්‍රහාර එල්ල වුණා..නමුත් මම තිසිසේත් ඒවා අනුමත කරන්නේ නෑ.අපි කිසිම දිනක කිසිම කෙනෙක්ට හිරිහැර කරලා නෑ.අපි ඔය අරගලයටවත් සම්බන්ධ වුණේ නෑ.අපේ නායක රත්නසේකර මැතිතුමා මේ අරගල එනකොට මාස දෙකක් තුනක් තිස්සේ ඉඳන් කීවා මේ තිබෙන ආණ්ඩුවට මේ තිබෙන තත්ත්වය පාලනය කරන්න බෑ,ඒ නිසා අගමැතිතුමා ඇතුළු කැබිනට් එක ඉල්ලා අස්වෙලා අන්තර්වාර පාලනයකට යන්න ඕන කියලා. රාජපක්ෂවරුන්ට ජාත්‍යන්තර සහය නෑ කීවා නිමල් දයානන්ද මන්ත්‍රීතුමා.ඒ මොකද අපර්ණ මන්ත්‍රීතුමා කීවා වගේ එතුමන්ලා ජාත්‍යන්තරය කියන විදිහට ගිවිසුම් අත්සන් කරන්නෑ.ජාත්‍යන්තරය කැමති ගිවිසුම්

ගහන අයට. ඉතින් ආධාර දෙන්නෙත් නෑ.ඒ කාරණාව යටතේ විදේශ ආධාර ලබා ගැනීමේ දුෂ්කරතාවයකුත් අපිට පසුගිය කාලයේ තිබුණා.පසුගිය කොවිඩ් වසංගතයත් එක්ක සංචාරක කර්මාන්තයෙන් ලැබුණ ඩොලර් නොලැබී ගියා.විදේශ ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ ඩොලර් මිලියන 7.5 ක් ලැබුණා.ඒක ඩොලර් මිලියන 5 දක්වා අඩු වුණා.ඩොලර් ඌනතාවක් ඒ නිසා ඇති වුනා.ආනයනික භාණ්ඩ වලට පසුගිය සෑම රජයක්ම වැය කරලා තිබුණා ඩොලර් මිලියන 30 ක්.නමුත් සෝටාභය රාජපක්ෂ මැතිතුමා මේ රට භාර ගත් පසු වාහන ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ පන්සිය ගණනක් නතර කිරීම තුල ඩොලර් මිලියන 22 දක්වා ඩොලර් මිලියන 8ක් ආනයනික භාණ්ඩල වලට යන වියදම කපා හැරියා.අපනයන ආදායම ලැබුණා. ඩොලර් මිලියන 7 ක හිඟයක් නිසා තමයි මේ රට තුල මේ අර්බුදය නිර්මාණය වුණේ.පිට රටින් ගේන හැමදේටම ඩොලර් ඕන.රට අර්බුදකාරී තත්ත්වයකට මුහුණ දුන් අවස්ථාවක රනිල් වික්‍රමසිංහ මහතා අගමැතිකම භාර ගැනීම සතුටුයි.එතුමාට හා මේ රට කරන්න සහයෝගය ලබා දෙන සියලු පක්ෂවල නායකයින්ට හා මන්ත්‍රීවරුන්ට මේ රට යම් මට්ටමකට ස්ථාවර කරගන්න හැකියාව ලැබෙන්න අපි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විදියට මේ රටේ පුරවැසියන් විදියට අපි ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු සභාපති බී.එම්. ධර්මසේන බමුණුසිංහ මහතා</u>

රනිල් වික්‍රමසිංහ මහතා අග්‍රමාත්‍යවරයා විදියට පත්වීම ගැන පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් හැටියට අපි එතුමාට ආශිර්වාද කළා.රටේ ජනතාවගේ බලාපොරොත්තුව එතුමාගේ නායකත්වයෙන් මේ රටේ දැවෙන ප්‍රශ්නවලට විසඳුම් ලබාදෙන්නට හැකිවෙතැයි විශ්වාස කරනවා.ජනතාව අපේක්ෂා කරන කාර්යභාරය ඉටුකරන්න එතුමාට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම නව අග්‍රාමාත්‍ය තුමාට පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සුභාශිංසන එකතු කරනවා.

**නව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සුභ පැතීම සඳහා විශේෂ යෝජනාවක් ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.**

**ඒ අනුව නව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සුභ පැතීම සඳහා විශේෂ යෝජනාවක් ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## IV. MG -330 මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ 2022 ජනවාරි 28 වන දින මුදල් කමිටු තීරණය පදිරි එදින සිට අප්‍රේල් 31 වන දින දක්වා වූ අලුත්වැඩියාව සම්බන්ධයෙන් ඇති වී ඇති අර්බුදය සම්බන්ධව කරුණු දැන ගැනීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

MG -330 මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ 2022 ජනවාරි 28 වන දින මුදල් කමිටු තීරණය පදිරි එදින සිට අප්‍රේල් 31 වන දින දක්වා වූ අලුත්වැඩියාව සම්බන්ධයෙන් ඇති වී ඇති අර්බුදය සම්බන්ධව කරුණු දැන ගැනීම සඳහා විශේෂ යෝජනාවක් ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා.එම යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සඳහා යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

MG -330 මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ 2022 ජනවාරි 28 වන දින මුදල් කමිටු තීරණය පදිරි එදින සිට අප්‍රේල් 31 වන දින දක්වා වූ අලුත්වැඩියාව සම්බන්ධයෙන් ඇති වී ඇති අර්බුදය සම්බන්ධව කරුණු දැන ගැනීම සඳහා විශේෂ යෝජනාවක් ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ධනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

මෝටර්ග්‍රේඩරය අලුත්වැඩියාව කිරීම සම්බන්ධව ක්‍රියාවලියේදී යම් ගැටළුවක් තිබෙනවා.2022.01.28 වගේ තිබුන කමිටුවේ මිල ගණන් දෙකක් ඉදිරිපත් වෙලා තිබුණා.එම මිල ගණන් වල පරස්පරතාවක් තිබුණ නිසා නැවත මිල ගණන් ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරන්න යෝජනා කලා. ගරු සභාපතිතුමණි,ලියාපදිංචි තැපෑලෙන් කැඳවන්න කියලා තිබෙන අවස්ථාවක අතින් භාර ගන්න එක හරිද මම දන්නේ නෑ. ජනවාරි මාසේ විසි අට වෙනි දින කමිටුවට ඉදිරිපත් කරලා තිබුණ මිල ගණන්වල පිරිවිතර අප්‍රේල් 20 දිනත් තිබුණේ.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා ප.ව.12.35 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා ප.ව.12.35 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**<u>ගරු සභාපති බී.එම්. ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

අපි තාම මුදල් ගෙවලා නෑ. ජනවාරි 28 මිල ගණන් කැඳවලා තියනවා.ඒක ඊට පස්සේ මුදල් කමිටුව විසින් ඒවා අවලංගු කරන්න කීවා.ඔබතුමාත් මුදල් කමිටුවේ ඉන්නවානේ. යාන්ත්‍රික ඉංජිනේරු තුමාගෙන් තමයි පිරිවිතර ගත්තේ. යාන්ත්‍රික ඉංජිනේරුතුමා ඇවිත් වාහනයේ අලුත්වැඩියා කටයුතු කරන්න තියනවාද කියලා බලලා නිර්දේශ ලබාදෙන්නේ.ඒ අනුව අපි මිල ගණන් කැඳවනවා.ඉන්පසුව මිල ගණන් 2ක් ලැබුණේ. මීළඟ සභා වාරයේ දි යාන්ත්‍රික ඉංජිනේරු තුමා ගෙන්වමු. එතකන් මුදල් ගෙවීම නතර කරමු. ඉදිරියේ දී සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නම්.ඔබතුමා මේ සභාව නොමඟ යවලා තිබෙන්නේ.සභාවේ කටයුතු නීත්‍යානුකූලව සිදු කරන්න අවශ්‍ය ක්‍රියාමාර්ග මම අනුගමනය කරලා තිබෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)</u>**

2022.01.28 රත්මුළුකන්දෙන් මිල ගණන් ඇවිත් තියනවා.මේකේ මෝටර් ග්‍රේඩරය අලුත්වැඩියා කිරීම සඳහා මේ මිල ගණන් සභාවට ආවාට පසුව මේක මුදල් කමිටුවට දානවා.මුදල් කමිටුව මිල ගණන් වල පරස්පරතාවක් ඇති බැවින් අදාල පිරිවිතරයන්ට අනුව ලියාපදිංචි තැපෑලෙන් දින හතක් ඇතුලත මිල ගණක් කැඳවීම සුදුසු බවට නිර්දේශ කරනවා.මේකේ පරස්පරතාවක් තිබෙන්නේ මුදල් වල විතරයි.මේ පිරිවිතර වලට අනුව නැවත මිල ගණන් කැඳවන්න කියලා තමයි අපි යෝජනා කරලා තිබෙන්නේ.එහෙම තිබෙද්දී තමයි 2022.02.03 වන දින මිල ගණන් නැවත දානවා.එම මුදල් කමිටුවේ දී එම මිල ගණන් තාක්ෂණ ඇගයීම් කමිටුවට යොමු කිරීමත්,එම කමිටුවේ නිර්දේශ මත සුදුසු ආයතනයකින් MG – 330 මෝටර් ග්‍රේඩරය අලුත්වැඩියා කිරීමත්,ඒ සඳහා ගෙවීම් කිරීමත් සුදුසු බව නිර්දේශ කරනවා.එදා යාන්ත්‍රික ඉංජිනේරුතුමා මෙතනට ආවා.අපිටත් එන්න කීවා.අපි ආපසු ආවේ නෑ.හැබැයි මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඉඳලා යාන්ත්‍රික ඉංජිනේරු මහතා සමඟ මෙම කාරණය සම්බන්ධයෙන් කතා කලාද මම දන්නේ නෑ.මේකේ මේ සියලු අයිතම වලට හත් ලක්ෂ හැත්තෑ පන් දහසයි තිබෙන්නේ.මේ හදන්න තිබෙන අයිතම පහෙන් තුනක්ම කැඩුණා.මේ වන විට මේකට ලක්ෂ 11 ක් වගේ මුදලක් ඉක්මවා ගිහින් තිබෙනවා.මේ කාරණා සම්බන්ධව අපිට ගැටළුවක් තිබෙනවා.මුලින් ඉදිරිපත් කල පිරිවිතරයන්ට අමතරව,ඒකට පරිබාහිරව වෙනත් වෙනත් දේවල් හදලා තිබෙනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා ප.ව.12.40 ට පමණ ගරු සභාවට පැමිණියා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු මන්ත්‍රීවරු මේ සම්බන්ධව අදහස් ඉදිරිපත් කලා.මම සියලු ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා තමන් කමිටුවකට පත් වුණා නම් ඒ කමිටුව සම්පූර්ණයෙන්ම අධීක්ෂණය කරන්න.අපි පුළුවන් තරම් මේ සඳහා මිල ගණන් දෙන්න කීවා.ආයතන දෙකකින් තමයි මිල ගණන් ඉදිරිපත් වුණේ.අපි මේ මෝටර් ග්‍රේඩර් අලුත්වැඩියා කරන ආයතන හෙව්වා.ඊට පස්සේ තමයි අපිට රත්මුළුකන්දේ ඒ ආයතනය ගැන දැන ගන්න ලැබුණේ.යාන්ත්‍රික ඉංජිනේරුතුමා නිර්දේශ කරලා තිබෙන පිරිවිතර පහට විතරක් අපි ඒ ආයතනයට මිල ගණන් දෙන්න කීවා.එයාලා දීලා තිබෙන්නේ අපි ඉදිරිපත් කල පිරිවිතර පහටත් වඩා වැඩියෙන්.මේක යන්ත්‍රයක්.හැබැයි චක්‍රලේඛයක් තිබෙනවා වාහනයක් ගලවලා හදාගෙන යනකොට අමතර දේවල් එන්න පුළුවන්.එහෙම දේවල් නැවත ආවාම නැවත මිල ගණන් කැඳවන්න සිදු වෙනවා.අපි ඒවාට මිල ගණන් කැඳවලා යාන්ත්‍රික ඉංජිනේරු මහතාගේ නිර්දේශ ඇතිව තමයි මුදල් කමිටුවට ඉදිරිපත් කලේ.මුදල් කමිටුවෙන් එදා ඒක කරන්න එපා කීවා නම් අපි මේක කරන්නේ නෑ.ඉන් පසුව තමයි ඔයිල් ප්‍රශ්නයක් ආවේ.අන්තිමට මෝටර් ග්‍රේඩරය මාස ගණනාවක් ගරාජ් එකේ.පාරවල් කැඩිලා.මිනිස්සු කෑ ගහනවා පාරවල් වල යන්න බෑ කියලා.ඒ නිසා මුදල් කමිටුවේ හා මහා සභාවේ අනුමැතිය අරන් අපි මේක හරියටම හදමු කියලායි වැඩේ පටන් ගත්තේ.මෝටර් ග්‍රේඩරයේ රෝදයක හුලන් බැස්සා කියලා අපිට මොබයිල් එක ගෙන්වන්න බෑ.අපි මේවාට තවම මුදල් ගෙවලා නෑ.නීත්‍යානුකූලව මේ සම්බන්ධව අපි කටයුතු කරලා තිබෙනවා.ඊළඟ සභා වාරයේ දී තාක්ෂණ නිලධාරී මහතාත්,යාන්ත්‍රික ඉංජිනේරු මහතාත්,අදාල ගරාජ් එකේ මහතාත් කැඳවලා මේ සම්බන්ධව විමසීමක් කරමු.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා ප.ව.12.43 ට පමණ ගරු සභාවට පැමිණියා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

මේ දෙයින් ඔය ආයතනය අපේ ආයතනය කෙරෙහි තිබෙන විශ්වාසය බිඳ වැටෙනවා නේද?අපිට ඉදිරියට මිල ගණන් එන්නේම නැති වෙයි.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ඊළඟ සභා වාරයේ දී තාක්ෂණ නිලධාරී මහතාත්,යාන්ත්‍රික ඉංජිනේරු මහතාත්,අදාල ගරාජ් එකේ මහතාත් කැඳවලා මේ සම්බන්ධව විමසීමක් කරමු.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

ඊළඟ සභා වාරයේ දී තාක්ෂණ නිලධාරී මහතාත්,යාන්ත්‍රික ඉංජිනේරු මහතාත්,අදාල ගරාජ් එකේ මහතාත් කැඳවලා මේ සම්බන්ධව විමසීමක් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ඊළඟ සභා වාරයේ දී තාක්ෂණ නිලධාරී මහතාත්,යාන්ත්‍රික ඉංජිනේරු මහතාත්,අදාල ගරාජ් එකේ මහතාත් කැඳවලා මේ සම්බන්ධව විමසීමක් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව ඊළඟ සභා වාරයේ දී තාක්ෂණ නිලධාරී මහතාත්,යාන්ත්‍රික ඉංජිනේරු මහතාත්,අදාල ගරාජ් එකේ මහතාත් කැඳවලා මේ සම්බන්ධව විමසීමක් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සහා සම්මත කරන ලදී.**

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

**MG -330 මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ 2022 ජනවාරි 28 වන දින මුදල් කමිටු තීරණය පදිරි එදින සිට අප්‍රේල් 31 වන දින දක්වා වූ අලුත්වැඩියාව සම්බන්ධයෙන් ඇති වී ඇති අර්බුදය සම්බන්ධව කරුණු දැන ගැනීම සඳහා විශේෂ යෝජනාවක් ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.**

**ඒ අනුව MG -330 මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ 2022 ජනවාරි 28 වන දින මුදල් කමිටු තීරණය පදිරි එදින සිට අප්‍රේල් 31 වන දින දක්වා වූ අලුත්වැඩියාව සම්බන්ධයෙන් ඇති වී ඇති අර්බුදය සම්බන්ධව කරුණු දැන ගැනීම සඳහා විශේෂ යෝජනාවක් ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සහා සම්මත කරන ලදී.**

**06.කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවෙලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.**

**I.2022.04.20 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.**

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2022.04.20දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සහා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

2022.04.20 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)</u>

2022.04.20දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2022.04.20 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.04.20දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.**

**I. 2022 අප්‍රේල් මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය)**

**උපලේඛන 01 සඳහා අනිත් පිට බලන්න.**

# උපලේඛන 01

| අය විෂය අංකය | වැය විෂය නාමයන් | 1 පොදු පරිපාලනය | 2 සෞඛ්‍ය සේවා | 3 භෞතික සැලසුම් මංමාවත් ඉඩම් | 4 ජල සේවා | 5 වෙනත් උපයෝගී සේවා | 6 සුභසාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැටුප් හා දීමනා | 2319096.93 | 1521493.17 | 1418965.59 | 42440.00 | 131373.28 | 2649539.74 | 8082908.71 |
| 2 | ගමන් වියදම් | 47840.00 | 0.00 | 8400.00 | 0.00 | 0.00 | 0.00 | 56240.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 339073.30 | 480101.00 | 354545.00 | 389462.00 | 0.00 | 22450.00 | 1585631.30 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු | 5200.00 | 7050.00 | 593799.98 | 2400.00 | 0.00 | 0.00 | 608449.98 |
| 5 | ප්‍රවාහන, සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 126179.33 | 17798.80 | 8980.00 | 557760.17 | 32702.40 | 47355.05 | 790775.75 |
| 6 | පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 106800.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 31795.00 | 138595.00 |
| 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 0.00 | 56937.82 | 0.00 | 0.00 | 0.00 | 14234.45 | 71172.27 |
| | **පුනරාවර්ථන වැය එකතුව** | **2944189.56** | **2083380.79** | **2384690.57** | **992062.17** | **164075.68** | **2765374.24** | **11333773.01** |
| | ප්‍රාග්ධන වියදම් | | | | | | | |
| 9 | ප්‍රාග්ධන වැය | 0.00 | 0.00 | 0.00 | 84893.15 | 0.00 | 17915.52 | 102808.67 |
| 10 | ණය ආපසු ගෙවීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | **ප්‍රාග්ධන වැය එකතුව** | **0.00** | **0.00** | **0.00** | **84893.15** | **0.00** | **17915.52** | **102808.67** |
| | **පුනරාවර්ථන වැය හා ප්‍රාග්ධක වැය එකතුව** | **2944189.56** | **2083380.79** | **2384690.57** | **1076955.32** | **164075.68** | **2783289.76** | **11436581.68** |
| | තැන්පත් | 677413.09 | | | | | | 786586.76 |
| | වැට් | 0.00 | | | | | | 0.00 |
| | ජාතිය ගොඩනැගීමේ බද්ද | 0.00 | | | | | | 0.00 |
| | මුද්දර බද්ද | 109173.67 | | | | | | 0.00 |
| | සේවක ණය | 980000.00 | | | | | | 980000.00 |
| | අත්තිකාරම් | 27720.00 | | | | | | 27720.00 |
| | ණයහිමි | 5308942.64 | | | | | | 5308942.64 |
| | සමුච්චිත අරමුදල | 0.00 | | | | | | 0.00 |
| | ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| | අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| | මුදල් මාරු | 20000.00 | | | | | | 20000.00 |
| | වෙනත් | 0.00 | | | | | | 0.00 |
| | **මුළු එකතුව** | **7123249.40** | | | | | | **18559831.08** |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 අප්‍රේල් මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය - (එ.ජා.ප.)</u>**

2022 අප්‍රේල් මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී.නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022 අප්‍රේල් මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 අප්‍රේල් මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 අප්‍රේල් මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## II. 2022 අප්‍රේල් මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය)

**උපලේඛන 02 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන 02

| අය විෂය නාමයන් | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැළසුම් මංමාවත්/ඉඩම් හා ගොඩනැගිලි | ජල සේවා | වෙනත් උපයෝගී සේවා | සුභ සාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 10 වරිපනම් හා බදු | 1907.00 | 33100.00 | - | - | - | 27750.00 | 62757.00 |
| 20 කුලී | - | - | 686625.00 | - | 1689896.00 | 0.00 | 2376521.00 |
| 30 බලපත්‍ර ගාස්තු | 0.00 | 47500.00 | - | - | - | 1200.00 | 48700.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 0.00 | 235867.00 | 70646845.00 | 85332.17 | - | 102740.00 | 71070784.17 |
| 50 වරෙන්තු ගාස්තු හා දඩ | 5762456.00 | 0.00 | 8990.00 | 0.00 | 11244.60 | 0.00 | 5782690.60 |
| 60 වෙනත් ආදායම් | 35453.80 | 26975.00 | 0.00 | 329319.55 | 0.00 | 290.00 | 392038.35 |
| 70වෙනත් ආධාර | 2030522.10 | 597450.00 | 1470550.00 | 42440.00 | 137460.00 | 2330254.00 | 6608676.10 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **7830338.90** | **940892.00** | **72813010.00** | **457091.72** | **1838600.60** | **2462234.00** | **86342167.22** |
| ප්‍රාග්ධන ආධාර | | | | | | | |
| 80 මූලධන ලැබීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **පුනරාවර්තන ආදායම් හා ප්‍රාග්ධන ආදායම්වල එකතුව** | **7830338.90** | **940892.00** | **72813010.00** | **457091.72** | **1838600.60** | **2462234.00** | **86342167.22** |
| තැන්පත් | 532578.66 | | | | | | 532578.66 |
| වැට් | 0.00 | | | | | | 0.00 |
| ජා.ගො.බද්ද | 0.00 | | | | | | 0.00 |
| මුද්දර බදු | 15100.00 | | | | | | 15100.00 |
| සේවක ණය | 427980.50 | | | | | | 427980.50 |
| අත්තිකාරම් | 37665.00 | | | | | | 37665.00 |
| ණය ගැති | 235180.23 | | | | | | 235180.23 |
| සමූ: අරමුදල | 0.00 | | | | | | 0.00 |
| ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| ශීර්ෂ බැර | 0.00 | | | | | | 0.00 |
| **මුළු එකතුව** | **1248504.39** | | | | | | **87590671.61** |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**
2022 අප්‍රේල් මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය - (එ.ජා.ප.)</u>**
2022 අප්‍රේල් මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී.නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**
2022 අප්‍රේල් මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**
2022 අප්‍රේල් මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 අප්‍රේල් මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## III. 2022 අප්‍රේල් මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව)

**උපලේඛන 03 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන 03

| අනු අංකය | අය විෂය | මාසය මුලදී හිඟය 1 | මාසය මුලදී ඉදිරියට ලැබීම් 2 | මාසය තුළ බිල් කිරීම් 3 | ලැබිය යුතු මුළු ආදායම 4 (1+3) | මාසය තුළ ලද ආදායම 5 | මාසයට අදාල කලින් ලැබූ ආදායම 6 | ඉදිරියට ගෙන යන කලින් ලැබූ ආදායම 7 ( 2-6) | මාසය තුළ ලද ආදායමින් ඉදිරියට ලැබූ ආදායම 8 | මාසය තුළ ලද ආදායමින් අය වූ හිඟය 9 | ඉදිරියට ගෙන යන හිඟය 10 4 - (5+6) | ඉදිරියට ලැබීම් 11 (7+8) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | වරිපනම් බදු 1/11 | 153449.77 | 908969.74 | 0.00 | 0.00 | 1087.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2 | අක්කර බදු 1/12 | 23507.34 | 4955.00 | 0.00 | 0.00 | 820.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 3 | කඩ කුලී 3/22 | 327550.00 | 46922.34 | 754100.00 | 1051650.00 | 699125.00 | 34942.34 | 11980.00 | 27317.34 | 12500.00 | 344900.00 | 39297.34 |
| 4 | වත්කම් බදු 5/23 | 1806059.82 | 25360.00 | 1145166.00 | 2951225.82 | 1292229.68 | 6920.00 | 18440.00 | 8250.00 | 169143.68 | 1660326.14 | 26690.00 |
| 5 | ජල ගාස්තු 4/62 | 1028244.34 | 58919.57 | 557256.00 | 1585500.34 | 329319.55 | 28518.64 | 30400.93 | 10604.00 | 53536.55 | 1184729.60 | 41004.93 |
| 6 | ව්‍යාපාර බදු 2/16 | 0.00 | 0.00 | 15600.00 | 15600.00 | 15600.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | කර්මාන්ත බදු 2/14 | 0.00 | 0.00 | 4000.00 | 4000.00 | 4000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 8 | වෙළඳ බලපත්‍ර 2/31 | 0.00 | 0.00 | 47500.00 | 47500.00 | 47500.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 9 | විශේෂ බලපත්‍ර ගාස්තු2/34 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 10 | එකතුව | 3338811.27 | 1045126.65 | 2523622.00 | 5655476.16 | 2389681.23 | 70380.98 | 60820.93 | 46171.34 | 235180.23 | 3189955.74 | 106992.27 |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 අප්‍රේල් මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය - (එ.ජා.ප.)</u>**

2022 අප්‍රේල් මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී.නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022 අප්‍රේල් මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 අප්‍රේල් මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 අප්‍රේල් මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## IV. 2022 ජුනි මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන 04

| ආදායම් ශීර්ෂය | වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව | | | මාසික ආදායම් පුරෝකථන | | | අය වී ඇති ආදායම 2022 අප්‍රේල් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අය - වැය ලේඛනය අනුව (1) | පරිපූරක මඟින් (2) | එකතුව3(1+2) | පෙර මාසය දක්වා (4) | මාසය තුළ(5) | එකතුව6(4+5) | පෙර මාසය දක්වා (7) | මාසය තුළ (8) | එකතුව 9(7+8) |
| වරිපනම් ( 1/11) | 1785000 | 0 | 1785000 | 751000 | 145100 | 896100 | 997196.98 | 1087 | 998283.98 |
| අක්කර බදු ( 1/12 ) | 50000 | 0 | 50000 | 24000 | 3500 | 27500 | 1878 | 820 | 2698 |
| කසල බදු(2/13) | 1000 | 0 | 1000 | 400 | 100 | 500 | 0 | 13500 | 13500 |
| කර්මාන්ත බදු(2/16/i) | 50000 | 0 | 50000 | 50000 | 0 | 50000 | 15500 | 4000 | 19500 |
| ඇතැම් ව්‍යාපාර බදු(2/16/iii) | 1000 | 0 | 1000 | 1000 | 0 | 1000 | 0 | 0 | 0 |
| ව්‍යාපාර බදු ( 2/16/ii ) | 2000000 | 0 | 2000000 | 2000000 | 0 | 2000000 | 917400 | 15600 | 933000 |
| බලපත්‍ර ගාස්තු ( 2/31/i ) | 1400000 | 0 | 1400000 | 1369000 | 5000 | 1374000 | 525133.15 | 47500 | 572633.15 |
| විශේෂ බල:ගාස්තු(2/31/ii) | 125000 | 0 | 125000 | 60000 | 65000 | 125000 | 0 | 0 | 0 |
| කඩ කුලී ( 3/22 ) | 8350800 | 0 | 8350800 | 3479500 | 695900 | 4175400 | 2141224.81 | 699125 | 2840349.81 |
| ජංගම අලෙවි කුටි( 3/22-i) | 297000 | 0 | 297000 | 297000 | 0 | 297000 | 262200 | 0 | 262200 |
| රථගාල් ගාස්තු(3/43/3) | 300000 | 0 | 300000 | 145000 | 25000 | 170000 | 52800 | 28800 | 81600 |
| ජල ගාස්තු(4/62,64) | 5800000 | 0 | 5800000 | 2415000 | 483000 | 2898000 | 1139070.65 | 526890.55 | 1665961.2 |
| සතිපොල බදු ( 5/22 ) | 8470000 | 0 | 8470000 | 3754000 | 520000 | 4274000 | 2013540 | 566810 | 2580350 |
| බදු කුලී ( 5/23 ) | 8214535 | 0 | 8214535 | 3285820 | 821455 | 4107275 | 8249899.2 | 1292229.68 | 9542128.88 |
| විනෝද බදු ( 6/15 ) | 400000 | 0 | 400000 | 157500 | 37500 | 195000 | 237705 | 27750 | 265455 |
| ප්‍රජා ශාලා/ක්‍රීඩා පි(6/25/2) | 160000 | 0 | 160000 | 56500 | 11000 | 67500 | 0 | 0 | 0 |
| එකතුව | 38889943 | 0 | 38889943 | 17845720 | 2812555 | 20658275 | 44248086 | 3224112.23 | 47472198.27 |

2022 ජුනි මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඒ.එන් පද්මා වීරසිංහ මහත්මිය - (එ.ජා.ප.)</u>**

2022 ජුනි මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022 ජුනි මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 ජුනි මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 ජුනි මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## V. 2022 මැයි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව

**උපලේඛන 05 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන 05

| අනු අංකය | වැය ශීර්ෂය | වාර්ෂික වියදම් ඇස්තමේන්තුව | | | වියදම් පුරෝකථනය | | | වැය කල මුදල | | | අතිරික්තය/ ඌනතාවය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අයවැය ලේඛනය | වැය ශීර්ෂ මාරු කිරීම / පරිපූරක | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | |
| 1 | වැටුප් දීමනා | 93270132.00 | | 93270132.00 | 31090044.00 | 7772511.00 | 38862555.00 | 29736672.22 | 8082908.71 | 8082908.71 | 30779646.29 |
| 2 | ගමන් වියදම් | 1064000.00 | | 1064000.00 | 310000.00 | 75000.00 | 385000.00 | 198060.00 | 56240.00 | 56240.00 | 328760.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 12263000.00 | 2000.00 | 12265000.00 | 3088000.00 | 1000000.00 | 4088000.00 | 3142046.36 | 1585631.30 | 1585631.30 | 2502368.70 |
| 4 | ප්‍රග්ධන වත්කම් අළුත් වැඩියාව හා නඩත්තුව | 14040000.00 | | 14040000.00 | 7600000.00 | 1000000.00 | 8600000.00 | 2384264.69 | 608449.98 | 608449.98 | 7991550.02 |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | 11474000.00 | | 11474000.00 | 4000000.00 | 1000000.00 | 5000000.00 | 1068390.00 | 790775.00 | 790775.00 | 4209225.00 |
| 6 | පොලී ගෙවීම් , ලාභාංශ සහ ප්‍රසාද මුදල් | 167360.00 | | 167360.00 | 22402.40 | 9000.00 | 31402.40 | 16152.73 | 9000.00 | 9000.00 | 22402.40 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 6138000.00 | | 6138000.00 | 1380000.00 | 658000.00 | 2038000.00 | 769500.00 | 138595.00 | 138595.00 | 1899405.00 |
| 8 | විශ්‍රාම වැටුප් ,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 968040.00 | | 968040.00 | 308000.00 | 75000.00 | 383000.00 | 264061.00 | 71172.27 | 71172.27 | 311827.73 |
| 9 | උපකරණ වැය | 34425000.00 | | 34425000.00 | 13000000.00 | 2600000.00 | 15600000.00 | 2281670.00 | 102808.07 | 102808.07 | 15497191.93 |
| 10 | ණය ආපසු ගෙවීම් | 2196000.00 | | 2196000.00 | 85858.83 | 300000.00 | 385858.83 | 62109.00 | 0.00 | 0.00 | 385858.83 |
| | එකතුව | 176005532.00 | | 176005532.00 | 60884305.23 | 14489511.00 | 75373816.23 | 39922926.00 | 11445580.33 | 11445580.33 | 63928235.90 |

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**
2022 මැයි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.
**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය - (එ.ජා.ප.)**
2022 මැයි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.
**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී.නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**
2022 මැයි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.
**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022 මැයි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.
**ඒ අනුව 2022 මැයි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**08.රැස්වීම කැඳවීමේ දැන්වීමේ වෙනත් කාරණා කිසිවක් දක්වා ඇත්නම්, ඒ කරුණු එහි දක්වා ඇති අනුපිළිවෙලට හෝ විශේෂ හේතු නිසා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට - නැත**

න්‍යාය පත්‍රානුකූලව ගරු සභාවේ කටයුතු අවසන් වූ බවත් ,2022 වර්ෂයේ මැයි මස මහ සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායක වූ සැමට ස්තූතිය පිරිනමන බවත්, ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.ප.ව.1.00 ට පමණ ගරු සභාවේ කටයුතු අවසන් කරන ලදී.

සටහන් කලේ :පී.ඒ.ඩී.එස්.දිසානායක,කළමනාකරණ සේවා නිලධාරී.

වාර්තා කලේ :එච්.ඒ.ජී.නිශ්ශංක,ලේකම්,පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.